# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2022.11.21 |

## `2021 ඔක්තෝබර් මාසයේ සිට දක්නට ලැබුණු ඉහළ යෑමේ ප්‍රවණතාව වෙනස් කරමින් ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 70.6ක් දක්වා පහළ ගියේය.

2021 ඔක්තෝබර් මාසයේ සිට ඉහළ යෑමේ ප්‍රවණතාවක් අනුගමනය කරන ලද ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 සැප්තැම්බර් මාසයේ දී පැවති සියයට 73.7හි සිට 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 70.6ක් දක්වා පහළ ගියේය. එසේම, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 85.8හි සිට 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 80.9 දක්වා පහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 62.8හි සිට 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 61.3 දක්වා පහළ ගියේය.

| උද්ධමනය | 2022 සැප්තැම්බර් | 2022 ඔක්තෝබර් |
|---|---|---|
| **මතුපිට** | | |
| දර්ශක අගය | 256.2 | 256.9 |
| මාසික වෙනස (%) | 2.3 | 0.3 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 73.7 | 70.6 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 36.9 | 42.2 |
| **මූලික** | | |
| දර්ශක අගය | 241.5 | 244.6 |
| මාසික වෙනස (%) | 2.7 | 1.3 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 64.1 | 62.4 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 31.0 | 35.7 |

මාසික වෙනස මගින් මනිනු ලබන ජා.පා.මි.ද. එහි මෑත කාලීනව දක්නට ලැබුණු මධ්‍යස්ථ ලෙස පහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 0.28 වාර්තා කළේය. මෙයට ප්‍රධාන වශයෙන් දායක වූයේ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් මාසිකව සියයට 0.41කින් පහළ යෑමයි. ඒ අනුව, ආහාර කාණ්ඩය තුළ, නැවුම් මත්ස්‍ය, සහල්, කරවල, සහ පොල් තෙල් මිල ගණන්හි සැලකිය යුතු පහළ යෑම් දක්නට ලැබුණි. එසේ වුවද, 2022 ඔක්තෝබර් මාසයේ දී සෞඛ්‍ය (ඖෂධ මිලදී ගැනීම සහ පෞද්ගලික රෝහල්/ සාත්තු නිවාස ගාස්තු), විනෝදාත්මක සහ සංස්කෘතික (අභ්‍යාස පොත් සහ ලිපි ද්‍රව්‍ය), ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ සහ ගෘහ ඒකක නඩත්තුව, මද්‍යසාර පාන වර්ග සහ දුම්කොළ, හා විවිධ භාණ්ඩ සහ සේවා යන උප කාණ්ඩයන්හි අයිතමවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ආහාර නොවන කාණ්ඩයේ සියයට 0.69 මාසික ඉහළ යෑමක් වාර්තා විය. කෙසේ වුවද, 2022 ඔක්තෝබර් මාසය තුළ දී ප්‍රවාහන (පෙට්‍රල් සහ ඩීසල්) උප කාණ්ඩයේ අයිතමවල මිල ගණන් පහළ යෑම ආහාර නොවන කාණ්ඩයේ සමස්ත මාසික ඉහළ යෑම සැලකිය යුතු ලෙස අඩු කිරීමට හේතු විය.

**ජා.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය (ප්‍රතිශත වෙනස)**




තවද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2022 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 36.9හි සිට 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 42.2 දක්වා ඉහළ ගියේය.

ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2022 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 64.1හි සිට 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 62.4 දක්වා පහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය, 2022 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 31.0හි සිට 2022 ඔක්තෝබර් මාසයේ දී සියයට 35.7 දක්වා ඉහළ ගියේය.

**ජා.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් ශ්‍රී ලංකාවේ සියලුම පළාත්වල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

**උප කාණ්ඩ අනුව ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**




## ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) |
| 2021 | ඔක්තෝබර් | 150.6 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 7.2 | 5.7 | 4.6 |
| | නොවැම්බර් | 155.3 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 8.8 | 6.2 | 5.0 |
| | දෙසැම්බර් | 161.0 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 10.8 | 7.0 | 5.5 |
| 2022 | ජනවාරි | 166.0 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 12.9 | 8.1 | 6.2 |
| | පෙබරවාරි | 167.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 14.1 | 9.3 | 7.1 |
| | මාර්තු | 172.7 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 17.3 | 10.6 | 8.2 |
| | අප්‍රේල් | 190.3 | 182.3 | 10.2 | 9.6 | 33.8 | 27.9 | 13.0 | 10.2 |
| | මැයි | 208.7 | 197.9 | 9.7 | 8.6 | 45.3 | 37.7 | 16.3 | 13.0 |
| | ජූනි | 231.5 | 215.9 | 10.9 | 9.1 | 58.9 | 49.3 | 20.8 | 16.8 |
| | ජූලි | 244.4 | 229.0 | 5.6 | 6.1 | 66.7 | 57.3 | 25.9 | 21.3 |
| | අගෝස්තු | 250.4 | 235.1 | 2.5 | 2.7 | 70.2 | 60.5 | 31.3 | 26.0 |
| | සැප්තැම්බර් | 256.2 | 241.5 | 2.3 | 2.7 | 73.7 | 64.1 | 36.9 | 31.0 |
| | ඔක්තෝබර් | 256.9 | 244.6 | 0.3 | 1.3 | 70.6 | 62.4 | 42.2 | 35.7 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව